ඉරෝෂ් රණසිංහ නොහොත් SF ලොකූ නමැත්තා වෙඩි තබා ඝාතනය කිරීම සම්බන්ධයෙන් රූපවාහිනී නාලිකාවන් මගින් පුවත් විකාශයන් ඔස්සේ වාර්තා කරන ලදී. එහිදී ඕනෑම අයෙකුට නැරඹීමට අපහසු, සංවේදී දර්ශනයන් ලෙසින් සැලකිය හැකි ඔහුගේ වෙඩි වැදුණු සිරුර වාහනයෙන් පිටතට ගන්නා ආකාරයත්, ඒ ආකාරයේම සංවේදී අන්තර්ගතයක් ලෙසින් සැලකිය හැකි කාන්තාවක් හඬන ආකාරයත් එම පුවත් විකාශයන් තුළ දැක්වී තිබුණේ මෙසේයි.

• සිරස ටීවී, ජාතික රූපවාහිනී, අද දෙරණ සහ ස්වර්ණවාහිනී - අදාළ දර්ශන බොඳ කර විකාශය කර තිබිණි.

• හිරු ටීවී සහ ස්වාධීන රූපවාහිනී - අදාළ දර්ශන කළු සුදු ලෙසින් විකාශය කර තිබිණි.

• හිරු ටීවී, සිරස, ස්වර්ණවාහිනී, ස්වාධීන රූපවාහිනී - කාන්තාවගේ හැඬීම ඉදිරිපත් කරයි.

• අද දෙරණ - කාන්තාවගේ හැඬීම ඉදිරිපත් නොකරයි.

• ජාතික රූපවාහිනිය - නිවේදකයාගේ හඬින් කාන්තාවගේ හැඬීම යටපත් වේ.

ප්‍රචණ්ඩත්වය පිළිබඳ කරුණු වාර්තා කිරීමේදී ඊට සම්බන්ධ ඡායාරූප හා චිත්‍ර, අවශ්‍ය සංවේදීතාවෙන් හා විචාර බුද්ධියෙන් යුතුව මෙන්ම, පොදුජන යහපත උදෙසා කරුණු ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ තමන්ගේ වගකීමට යටත්වද ඉදිරිපත් කිරීමට පුවත්පත විශේෂයෙන් සැලැකිලිමත් විය යුත්තේය යනුවෙන් ශ්‍රී ලංකා කර්තෘ සංසදයෙන් ඉදිරිපත් කළ වෘත්තිය ප්‍රතිපත්ති මාලාව ඔස්සේ දැක්වේ.මෙවන් සංවේදී දර්ශනයන් නැරඹීමට සහ ඇසීමට සෑම ප්‍රේක්ෂකයෙකුටම අපහසු විය හැක.

එවන් අන්තර්ගතයන් විකාශය කිරීමේදී විශේෂයෙන්ම සැලකිලිමත් විය යුතු බවට මාධ්‍ය ආචාර ධර්මයන් ඔස්සේ උපදෙස් ලබාදෙන්නේ ඒ හෙයිනි. එවන් අන්තර්ගතයන් ඉදිරිපත් කිරීම සඳහා රූපවාහිනී නාලිකාවන් භාවිතා කර ඇති ඉහත සඳහන් ක්‍රමවේදයන් සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaNews #TVChannels #News #SirasaTV #TVDerana #HiruTV #ITN #Rupavahini #Swarnavahini